**එම්. යූ. එම්. අලි සබ්රි,** පා. ම.
எம். யூ. எம். அலி ஸப்ரி, பா. உ.
**M. U. M. Ali Sabry,** PC, M.P.
**විදේශ කටයුතු අමාත්‍ය**
வெளிநாட்டு அலுவல்கள் அமைச்சர்
**Minister of Foreign Affairs**

## "ඊද් අල් ෆිත්ර්" සුභපැතුම් පණිවුඩය

අප නිර්වචනයට ලක් කරන්නා වූ සමගිය, සාමය හා සහකම්පනය යන චිරස්ථායී සාරධර්ම, ආධ්‍යාත්මික සුවිශේෂිබවෙහි හා සම්ප්‍රදායේ මුල්බැසගෙන ඇති මෙම උතුම් අවස්ථාවේදී ගෞරවයට පාත්‍ර වෙයි. උපවාසය අවසන් කිරීමේ උත්සවය වන ඊද් අල් ෆිත්ර් උළෙලෙහි අවසානය උත්සවශ්‍රීයෙන් සහ ප්‍රජා සමගියෙන් පිරි සමයකින් සුවිශේෂි ලෙස සනිටුහන් කෙරෙයි. අපගේ විශ්වීය මනුෂ්‍යත්වය හා පොදු අපේක්ෂා පිළිබඳ හෘදයංගම සිහිකැඳවීමක් ලෙස ක්‍රියා කරන මෙම අවස්ථාව ආගමික හා සංස්කෘතික සීමා සමාතික්‍රමණය කරයි. පවිත්‍ර රාමදාන් මාසය තුළ උගත් පාඩම් මනා ලෙස ග්‍රහණය කරගනිමින්, කරුණාව, ත්‍යාගශීලීත්වය හා අන්‍යෝන්‍ය ගෞරවය යන ප්‍රතිපත්ති කෙරෙහි ඇති අපගේ කැපවීම අපි යළි තහවුරු කරන්නෙමු.

මේ වසරේ ඊද් උළෙල සමරන්නට අප එක් වන මොහොතේ, දේශීය වශයෙනුත් ගෝලීය වශයෙනුත් අප මුහුණ දෙන අභියෝග ගැන සිතා බලන්නට අපි මඳකට නතර වෙමු. සහයෝගීතාව හා උදවු අවශ්‍ය කරන අයට සහයෝගයේ අත දිගු කරන්නට ඊද් උළෙලේ ප්‍රීතිමත් ජීවගුණය අප තුළ අභිප්‍රේරණය ඇති කරත්වා, එමගින්, සෑම පුද්ගලයකුගේම අභිමානයට වටිනාකමක් ලබාදෙන, එයට ගරු කරන, සියලු දෙනා අන්තර්ගත සමාජයක් ගොඩනැඟේවා යන්න මගේ පැතුමයි.

ශ්‍රී ලංකාව නිර්වචනයට ලක් කරන්නා වූ ප්‍රත්‍යස්ථිතිය හා සමගිය, විශේෂයෙන්ම අද දින අපගේ මනසට නැඟේ. විවිධ සංස්කෘති සහ ආගම්වලින් නිර්මිත විචිත්‍ර ගෙත්තමක් වූ අපගේ ජාතිය විවිධත්වය තුළ හමුවන්නා වූ ශක්තිමත්භාවයට සාක්ෂියකි. අප ඉදිරියට ගමන් කරත්ම, සාමකාමී, සමෘද්ධිමත් හා එකමුතු ශ්‍රී ලංකාවක් පෝෂණය කරන්නට අප දරන්නා වූ සාමුහික ප්‍රයත්නවලට මහ පෙන්වන්නට ඊද් උළෙලේ මූලධර්මවලට අපි ඉඩ හරිමු. ලොව පුරා සිටින අපගේ මිතුරන්ට මම මිත්‍රත්වයේ සහ හොඳහිතෙහි පණිවුඩයක් දිගුකරන්නෙමි. ඊද් උළෙලෙහි සැබෑ හරය සිතෙහි දරා ගනිමින්, බාධක මැඩගෙන සහයෝගීතාවෙන් හ අවබෝධයෙන් සපිරි ගෝලීය ප්‍රජාවක් පොහොණි කිරීමෙහිලා අප තුළ ඇති තිර අදිටන අපි ශක්තිමත් කර ගනිමු.

සාමය හා සමගිය ප්‍රාප්ත කරගැනීමේ ව්‍යායාමයේ වඩාලාත් සාර්ථකබවක් ලබා ගැනීමට අප ප්‍රයත්න දරන මේ අවස්ථාවේදී මේ ඊද් අල් ෆිත්ර් උළෙල හුදු ප්‍රීති උත්සව පැවැත්වීමෙන් ඔබ්බට ගිය අවස්ථාවක් වේවායි යන්න මගේ පැතුමයි. ගාසා තීරයේ වසන ජනතාව වෙනුවෙන් යාඥා කොට ඔවුන් විඳින්නා වූ අසීරුතා වලට සාධාරණ හා සාමකාමී විසැඳුමක් ලබා දීම උදෙසා අපි කටයුතු කරමු . සියලු දෙනා උදෙසා වඩාත් අපේක්ෂා සහගත අනාගතයක් නිර්මාණය කිරීමට වෙහෙස නොබලා කටයුතු කිරීමෙන්, මේ දිනය මූර්තිමත් කරන්නා වූ මූලධර්ම සාමූහික වශයෙන් ඉහළට ඔසවා තබන්නට අපට පුළුවන.

ඔබටත් ඔබගේ ආදරණීයයන්ටත් සතුට, යහපත් සෞඛ්‍යය හා සමෘද්ධිය උදා වේවා. "ඊද් මුබාරක්"

**එම්.යූ.එම්. අලි සබ්රි**
**විදේශ කටයුතු අමාත්‍ය**